




කොට්ටව කෝඹල වනාන්තරය ස්වභාවධර්මයේ අපූර්ව නිර්මාණයකි. ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මෙම වනාන්තරය ගාල්ල නගරයේ සිට කි. මී. 15 ක් පමණ දුරින් ගාල්ල උඩුගම බස් මාර්ගය දෙපසින් පිහිටා ඇති අතර මෙම වනාන්තරය හෙක්ටයාර් 1800 ක පමණ භූමිභාගයක පැතිරි තිබේ. දේශගුණික හා භූවිෂමතාව ලක්ෂණ අනුව මෙම වනාන්තරය නිවර්තන තෙත් සදාහරිත (පහත රට තෙත් වනාන්තරයක්) ලෙසින් හඳුන්වයි. නිවර්තන තෙත් සදාහරිත වනාන්තරවලට පොදුවූ ස්ථිරභවනය (නෙරුශාක, උඩුවියන උපවියන යටිවියන යටි රෝපණය) ස්ථම්භාකාර ඍජු කඳන් සහ කයිරු සහිත ශාකවලින් සමන්විතයි. මෙම වනයේ වේවැල් රදලිය වැනි වැල් වර්ග මෙන්ම ඕකිඩ් වැනි අපි ශාකද බාඳුරා වැනි මාංශ භක්ෂණ පැළ වර්ගද දැකිය හැකිය.







කොට්ටව වනාන්තරයේ බහුල වශයෙන් හොරකුලයේ ශාක විශේෂයන්ද බහුලය. බුහොර, දියපර, ගොඩපර, ආරිද්ද, හැඩවක, වැලිපියෑන්න, බදුල්ල විශේෂ, පැලියකූර, බැදිදෙල්, ඌරුහොඬ, ඇටඹ, රුක්, වල් දිවුල්, කිරිබද්ද, දියනා,

දොඹකීන, ගොරක, කැකුණ ආදී ශාක වැඩියෙන් දැකිය හැකියි. ප්‍රජාවට අවශ්‍ය ආහාර නිෂ්පාදනයෙහිලා මහඟු දායකත්වයක් අතීතයේදී මේ වනාන්තරයෙන් සිදුවිය. ගන්දෙල්, හල්, බෙරලිය, අඹ වැනි ගස් නිදසුන්ය. මේ වනාන්තරයේ තුරුවියන ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව වැඩි දියුණු කරයි. වාතය පිරිසිදු කෙරේ. දේශගුණික සමතුලිත බව ආරක්ෂා කරයි. ගංගා පෝෂක ප්‍රදේශයකි. විශේෂයෙන් නිරිතදිග මෝසමෙන් ලැබෙන වැහි ජලය ගබඩාකරගන්නා තැනකි. මෙම වනය මැද ඇති ඇළ දොළ ගංගා මනහරය. සෞන්දර්යාත්මක වශයෙන් පරිසරවේදීන්ගේ ඇගයීමට ලක්වේ.



1990 දී කළ සමීක්ෂණයකට අනුව ශාක විශේෂ 153 ක් වාර්තා විය. ඉන් 65 ක් ඒක දේශීය ශාකයන්ය. සත්ව විශේෂ ගැන සලකා බැලීමේදී මත්ස්‍ය විශේෂ 17 න් 6 ක් උභය ජීවීන් (ඇම්පිබියානුවන්) වර්ග 14 න් 6 ක් පාද හතරේ උරග විශේෂ 14 න් 5 ක් පාද රහිත උරග විශේෂ 20 න් 7 ක් ඒක දේශීය සත්ව විශේෂ වශයෙන් සොයාගෙන ඇත. තවද එහි පක්ෂි වර්ග 57 න් 12 ක් ද ක්ෂීරපායී විශේෂ 28 න් 4 ක් ද ඒක දේශීය සත්ව විශේෂ වශයෙන් හඳුනාගෙන ඇත. මීට අමතරව අගනා ලංකා රෝස නැමති විශේෂයද සහිතව සමනල විශේෂ 40 ක් පමණ සොයාගෙන ඇත.

සියවස් ගණනක අතීතයකට උරුමකම් කියන කොට්ටව කෝඹල වනාන්තරය කන්නෙලිය දෙදියගල සහ නාකියාදෙණිය වනාන්තරවලට යාවූ සෞන්දර්යාත්මක පෙදෙසකි.

මුල් කාලයේ සිංහරාජ වනාන්තරයට උතුරු දෙසින් සම්බන්ධ වූවකි. මෙහි උසම ප්‍රදේශය ගැන සැලකෙන කැකිල්ලගල කන්ද, අක්කර 1/2 ක් පමණ වන භූමි

ප්‍රදේශයකි. එම කන්දට නගින ඕනෑම කෙනෙකුට කොට්ටව වනාන්තරයේ අසිරිය මෙන්ම ගාල්ල අවට ප්‍රදේශයද දැකිය හැකියි. 1870 දී මේ වනාන්තර ප්‍රදේශය අක්කර 3000 කට වැඩිය. තෙත් බවින් යුතු වනාන්තරයේ තැනින් තැන මතු වූ බොහෝමයක් ජල පහර නිසා,සිසිල් බවින් පිරුණු හියාරේ වනපෙත, දනන් සිත් තුළ මතු කරන්නේ අපූර්වත්වයකි. සියත් ආරු නම් දිය ඇලි හේතුවෙන් ‘ සියත් ආරු’ කාලයක් සමඟ පරිණාමය වී හියාරේ යන නම ගමට යෙදී ඇත. එම හියාරේ ගමට දායාද වූ හියාරේ වන පෙත, නැත්නම් හියාරේ රක්ෂිත වන පෙත, නරඹන්නන්ගේ ගත සිත පිනවන සුන්දර වන උද්‍යානයකි. මෙය ඉතා ම දුර්ලභ ගණයේ වන්නාන්තරයකි. ඒ නිසා ම එහි වටිනාකම වැඩි ය. බොහෝ දේ උරුම කර ගත් මේ වන උද්‍යානය, ලක්වැසි අප ලද මහඟු දායාදයකි.



